ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ශක වර්ෂ 1945



# 2023

# සිංහල අලුත් අවුරුදු නැකත් චාරිත්‍ර

## නව සඳ බැලීම

අභිනව චන්ද්‍ර වර්ෂය සඳහා මාර්තු මස 23 වන බ්‍රහස්පතින්දා දින ද අභිනව සූර්ය වර්ෂය සඳහා අප්‍රේල් මස 23 වන ඉරිදා දින, නව සඳ බැලීම මැනවි.

## පරණ අවුරුද්ද සඳහා ස්නානය

අප්‍රේල් මස 12 වන බදාදා දින කොහොඹපත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කොට ඉෂ්ට දේවතා අනුස්මරණයෙහි යෙදී වාසය මැනවි.

## අලුත් අවුරුදු උදාව

අප්‍රේල් මස 14 වන සිකුරාදා දින අපරභාග 02.59 ට සිංහල අලුත් අවුරුද්ද උදාවෙයි.

## පුණ්‍ය කාලය

අප්‍රේල් මස 14 වන සිකුරාදා පූර්වභාග 8.35 සිට එදින අපරභාග 9.23 දක්වා පුණ්‍ය කාලය බැවින් අප්‍රේල් මස 14 වන සිකුරාදා පූර්ව භා. 8.35 ට පළමුව ආහාර පාන ගෙන සියලු වැඩ අත්හැර ආගමික වතාවත්වල යෙදීම ද පුණ්‍ය කාලයේ අපර කොටස ; එනම් අප්‍රේල් මස 14 වන සිකුරාදා අපරභාග. 2. 59 සිට අපරභාග 9.23 දක්වා පහත දැක්වෙන අයුරින් අහාර පිසීම වැඩ ඇල්ලීම ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදී නැකත් චාරිත්‍ර විධි ඉටු කිරීම මැනවි.

## ආහාර පිසීම

අප්‍රේල් මස 14 වැනි සිකුරාදා අපරභාග 3.29 ට විචිත්‍ර වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා ලිප් බැඳ ගිනි මොළවා දීකිරි මිශ්‍ර කිරිබතක් ද තල සහ විලද මිශ්‍ර කැවිලි වර්ගයක් ද පිළියෙල කරගැනීම මැනවි.

## වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය

අප්‍රේල් මස 14 වැනි සිකුරාදා අපරභාග 5.05 ට විචිත්‍ර වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා සියලු වැඩ අල්ලා ගනුදෙනු කොට ආහාර අනුභව කිරීම මැනවි.

## හිසතෙල් ගෑම

අප්‍රේල් මස 16 වැනි ඉරිදා පූර්වභාග 09.41 ට රතු සහ කහ මිශ්‍ර වර්ණ (තඹ පැහැති) වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා හිසට ඉඹුල්පත් ද පයට නුගපත් ද තබා ඉඹුල් පත් යුෂ මිශ්‍ර නානු හා තෙල් ගා ස්නානය කිරීම මැනවි.

## රැකිරක්ෂා සඳහා පිටත්ව යෑම

අප්‍රේල් මස 17 වැනි සඳුදා පූර්වභාග 6.28 ට ශ්වේත වර්ණ හෙවත් සුදු පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී දීකිරි මිශ්‍ර කිරිබතක් හා කැවිලි වර්ගයක් අනුභව කර දකුණු දිශාව බලා පිටත්ව යෑම මැනවි.

## පැළ සිටුවීම

අප්‍රේල් මස 20 වැනි බ්‍රහස්පතින්දා පූර්වභාග 06.38 ට රන්වන් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා පැළ සිටුවීම මැනවි.

සැ.යු ඉහත නැකත් වේලාවන් දැනට සම්මත ඔරලෝසු වේලාවෙන් සකස්කර ඇත්තේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ඇතිව සිංහල අලුත් අවුරුදු රාජ්‍ය නැකත් කමිටුව විසිනි. මෙම වේලාවන් ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශවලට නොවෙනස්ව භාවිතා කළ හැකිය.

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

**බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**